# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல DSD/HO/MF/05/08/01/ චක්‍රලේඛ<br>My No | ඔබේ අංකය<br>உமது இல ……………………<br>Your No | දිනය<br>திகதி 2025.04.02<br>Date |

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක - 2025/07
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/බැංකු සමිති කළමනාකරුවන්,

**<u>"අපේකම රැකගනිමු - ඉතුරුමට මඟ කියමු"</u>**

**<u>සිංහල හා හින්දු අළුත් අවුරුදු ගණුදෙනු චාරිත්‍රයට සමගාමීව සමෘද්ධි බැංකුවල ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2025</u>**

## 01. හැඳින්වීම

**"හෙළයේ මහා සංස්කෘතික මංගල්‍යය"** වන සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය දිවයින පුරා සියළු නගර හා ගම්වල ජීවත්වන සියළු ජනතාව එකමුතුව, සහෝදරත්වය සහිතව උත්සවශ්‍රියෙන් සමරයි.

එම අභිමානය තවදුරටත් රැකගැනීම පෙරදැරිව මෙවරත්, සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය සැමරීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු ජාලය ද එකතුවීමට අදහස් කර ඇත.

ඒ අනුව, 2025 වර්ෂයේ සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව සමෘද්ධි බැංකුවහි පවත්වාගෙන යන ඉතුරුම් ගිණුම් සඳහා තැන්පතු රැස්කිරීමත්, නව ගණුදෙනුකරුවන් ආකර්ශනය කර ගැනීමේ අරමුණින් අළුත් අවුරුදු ගණුදෙනු චාරිත්‍රය සිදු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

2025 වර්ෂයේ අප්‍රේල් මාසයට යෙදෙන සිංහල හා හින්දු අළුත් අවුරුද්දට සමගාමීව සමෘද්ධි බැංකු විසින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

1. සිංහල හා හින්දු අළුත් අවුරුදු ගණුදෙනු චාරිත්‍රය සිදු කිරීම.
2. ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධනය හා ඉතුරුම් මුදල් රැස් කිරීම සඳහා ප්‍රවර්ධන කාලයක් ක්‍රියාත්මක කිරීම.

මෙම වැඩසටහන් සමෘද්ධි බැංකුව.ග්‍රාම නිලධාරි වසම් හා ප්‍රජාමූල සංවිධාන මට්ටමින් පැවැත්වීම සඳහා අවශ්‍ය අනුමැතිය හා ඊට අදාල උපදෙස් සමෘද්ධි බැංකු / බැංකු සමිති කළමනාකරන මණ්ඩලය විසින් ලබාදී ඇත. ඒ අනුව මෙම චක්‍රලේඛ උපදෙස් සකස් කර නිකුත් කරන බව දන්වමි.

## 02. සිංහල හා හින්දු අළුත් අවුරුදු ගණුදෙනු චාරිත්‍රය

1. 2025.04.15 දින පෙ.ව.8.30 සිට දවස පුරා සමෘද්ධි බැංකු මූලික කරගෙන අළුත් අවුරුදු චාරිත්‍රය වෙනුවෙන් ගණුදෙනු කිරීමට ගණුදෙනුකරුවන්ට අවස්ථාව ලබා දීම සිදුකළ යුතුය.

2.එදින සමෘද්ධි බැංකුව සමඟ ගණුදෙනු කරන සෑම ගිණුම් හිමියෙකුටම ගණුදෙනුකරන අවස්ථාවේදී රු.10.00ක කාසියක් තුටු පඬුරක් බුලත් කොළයක තබා පිළිගැන්විය යුතුය. ඒ සඳහා වැයවන මුදල් වැය ගිණුම - ඉතුරුම් ප්‍රවර්ධන කටයුතු ගිණුමට හර කළ යුතුය.

3. තවද, පැමිණෙන ගණුදෙනුකරුවන් ,බැංකු පාලක මණ්ඩල සාමාජිකයින්, නිලධාරින් සඳහා එදින සමෘද්ධි බැංකුව මගින් සංග්‍රහයක් සංවිධානය කර පිළිගැන්විය යුතුය. ඒ සඳහා උපරිම රු.3000.00ක මුදලක් වැය කළ හැක.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

**03. සිංහල හා හින්දූ අළුත් අවුරුදු ගණුදෙනු චාරිත්‍රයට සමගාමීව ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.**

1. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන සමෘද්ධි බැංකුව හා සියළු ග්‍රාම නිලධාරි වසම් වල ක්‍රියාත්මක කළ යුතුය. අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන 2025.04.15 දින සිට 2025.04.22 දක්වා කාලය පුරා පැවැත්විය යුතුය.

2. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ අනිවාර්ය ඉතිරිකිරීම් තැන්පතු හැර අනෙකුත් සියළුම ඉතුරුම් තැන්පතු ගිණුම් සඳහා තැන්පතු රැස් කිරීමට හැකිය.

3. ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී, පාලක මණ්ඩල සමාජිකයින්, ප්‍රජාමූල සංවිධානවල නිලධාරින්ගේ සහය ලබාගත යුතුය.

4. ක්ෂේත්‍ර මට්ටමින් රැස්කරන තැන්පතු මුදල් අදාල නිලධාරින් විසින් එකඟ වූ පරිදි සමෘද්ධි බැංකුවට ගෙනැවිත් භාරදිය යුතුය.

**04. ඉතුරුම් සඳහා තිළිණ ලබාදීම.**

1. රු.1000.00 හෝ ඊට වැඩි තැන්පතු මුදල් සඳහා තිළිණයක් ලබාදිය යුතුය. නමුත් ස්ථාවර තැන්පතු සඳහා තිලිණ ලබාදීම සිදු නොවේ, දැනටමත් ස්ථාවර තැන්පතු සඳහා ඉහළ තැන්පතු පොළී අනුපාතයක් සමෘද්ධි බැංකු මඟින් ගෙවීම සිදුකරන බැවිනි.

2. ඉතුරුම් ප්‍රවර්ධන කාලය තුල, ආරම්භ කරන නව ගිණුම් හා දැනට පවතින ඉතුරුම් ගිණුම් සඳහා මුදල් තැන්පතු සිදුකරන ගිණුම් හිමියන්ට තිළිණ ලබාදීම සිදුකල යුතුය. එහිදි, ප්‍රවර්ධන කාලය තුල රැස්කරන මුළු තැන්පතු මුදලට (ස්ථාවර තැන්පතු හැර) සාපේක්ෂ 5%ක මුදලක් තිළිණ සඳහා වැයකළ හැක.

උදා:- “A” සමෘද්ධි බැංකුව ප්‍රවර්ධන කාලය තුළ ගිණුම් හිමියන් 125 දෙනෙකුගෙන් රු.100,000/-ක තැන්පතු මුදලක් රැස්කරගෙන ඇත. තිළිණ සඳහා වැයකළ හැකි මුදල වනුයේ,

$$\frac{100{,}000}{100} \times 5 = \text{රු.}5000.00$$

3. බැංකු සමිතියට අයත් සියළු බැංකුවල මෙම වැඩසටහන යටතේ තිළිණ ලබාදීමේදී එකම ක්‍රමවේදයක් අනුව සිදු කිරීම හා තීරණ ගැනීමට පහත කමිටුව පත් කරනු ලබයි.

* සමෘද්ධි බැංකු සමිති කළමනාකරු
* විධායක කමිටු සභාපති
* සමෘද්ධි බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්
* සමෘද්ධි බැංකු කළමනාකරුවන්
* මූලස්ථාන කළමනාකරුවන්
* ව්‍යාපෘති කළමනාකරුවන්

4. තිළිණ මිලදී ගැනීම සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2025/03 හි ඡේද අංක 04 හි සඳහන් ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකල යුතුය. එහිදි, මුදල් සීමාවන් ඉක්මවන අවස්ථාවක එම චක්‍රලේඛයේ ඡේද අංක 03 හි සඳහන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මඟින් ද තීරණ ගැනීමේ බලය ඇත.

5. ප්‍රසම්පාදන කමිටු ක්‍රියාවලිය යටතේ තීරණ ගැනීමේදී මිලදී ගන්නා භාණ්ඩවල **“...................... සමෘද්ධි බැංකුව”** නමින් නම මුද්‍රණය කිරීම හෝ ස්ටිකර් ඇලවීම සිදු කිරීමටද කටයුතු කළ යුතුය. තවද භාණ්ඩ ලැබීමට පෙර අත්තිකාරම් මුදල් ලබාදීම නොකළ යුතුය.

6. ස්වේච්ඡා සංවිධානවල සාමාජික නොවන හා සමූහ තැන්පත් ගිණුම් සඳහා තිළිණ ලබාදීමේදී ,සුදුසු තිළිණයක් ලබාදීමට අවශ්‍ය තීරණ ගැනීම අදාල කමිටුවට බලය ඇත.

7. තිළිණ සඳහා මුදල් ත්‍යාග නොදිය යුතු අතර, තවද තිළිණ ලබාදෙන තැන්පතු මුදල් මාස 12ක් අදාල ගිණුමේ රඳවා ගැනීමද (HOLD) සිදුකළ යුතුය.

යම් අවස්ථාවක ,රඳවාගනු ලබන මුදල් මාස 12කට පෙර ආපසු ගැනීමට ඉල්ලුම් කරන ගිණුම් හිමියන්ට තැන්පතු මුදල් නිදහස් කළ හැක. එහි දි, තිළිණ සඳහා වැයවූ මුදලින් 50% ක් ආපසු ලබාගත යුතු අතර එම මුදල ලද ආදායම් - මිශ්‍ර ගිණුමට රැස් කළ යුතුය. තවද, පිළිගත හැකි විශේෂ හේතුවක් මත (මරණයක්, පූර්ණ දුබලතාවයක්, අසාධ්‍ය රෝගී තත්වයක්) වැනි තත්වයන් යටතේ මුදල් ආපසු ලබාගැනීමට ඉල්ලුම් කරන විටක තිළිණ සඳහා වැය වූ මුදල් ආපසු නොගෙන මුදල් නිදහස් කිරීමේ බලය කළමනාකරුට පැවරේ.

8. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනට ජනතාව ආකර්ශනය සඳහා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීමට පෙර තිළිණ සඳහා ලබාදෙන අයිතමයන් සමෘද්ධි බැංකුවේ ප්‍රදර්ශනය කිරීම වඩාත් උචිත වන අතර, එබැවින් ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කර අදාල තීරණ බැංකුව වෙත ලබාදීම සිදුකරන ලෙසත් තවදුරටත් දන්වමි.

## 05. සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සව පැවැත්වීම.

1. 2025 වර්ෂයේ සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව අළුත් අවුරුදු උත්සව සමෘද්ධි බැංකු මට්ටමින් පැවැත්වීම මෙවර සිදුනොවන බව දන්වමි.

2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සම්බන්ධව, මැතිවරණ කොමිෂන් සභාව විසින් 2025.03.03 නිකුත් කරන ලද අංක 2426/6 දරණ විශේෂ චක්‍රලේඛනයක් නිකුත් කර ඇති බැවින්, ඊට අනුගත වෙමින් අළුත් අවුරුදු උත්සව පැවැත්වීම සිදු නොකරන ලෙස සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය ලබා දුන් උපදෙස් මත මෙම තීර්ණය ගත් බව දන්වමි.

2. නමුත්, සමෘද්ධි බැංකු මඟින් සපයන සේවා සඳහා ප්‍රචාරණයක් ලබා ගැනීම හා බැංකුව සමඟ ගනුදෙනු කරන ජනතාවගේ සුභසිද්ධිය ඇති කිරීම උදෙසා සමෘද්ධි බැංකු බලප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම්වල පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, සමෘද්ධි කැකුළු ළමා සමාජ හෝ ලියාපදිංචි ක්‍රීඩා සමාජ විසින් පැවැත්වීමට සංවිධානය කර ඇති අළුත් අවුරුදු උත්සව සඳහා ප්‍රචාරණ මූල්‍ය අනුග්‍රහයක් ලබා දීමට අවසර දෙනු ලැබේ.

ඒ අනුව, එක් සමෘද්ධි බැංකුවකින් උපරිම රු.10,000/-ක මුදලක් මූල්‍ය අනුග්‍රහයක් ලෙස ලබාදීමට හැක. මෙහිදි පහත පරිදි කටයුතු කරන ලෙසත් දන්වමි.

01. සංවිධානය මඟින් මූල්‍ය අනුග්‍රහය ලිඛිතව ඉල්ලුම් කර තිබීම.
02. එම ඉල්ලීම බැංකු පාලක මණ්ඩල දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීම.
03. අනුග්‍රහක මුදල පහත පරිදි චෙක්පතකින් හෝ ඉතුරුම් ගිණුමක් හරහා ලබාදීම සිදුකළ යුතුය.
    වැය ගිණුම - බැංකු ප්‍රවර්ධන කටයුතු - හර (කේත අංකය 2134)
    ජංගම ගිණුම/............. ඉතිරි කිරීමේ තැන්පත් ගිණුම- බැර
04. චෙක්පත /මුදල් භාරගත් බවට අදාල සංවිධානයේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික විසින් ලිඛිතව අත්සන් කර ලිපියක් බැංකුවට භාරගත යුතුය.
05. අදාල මූල්‍ය අනුග්‍රහය ලබාදෙන සංවිධානයට මෙම අළුත් අවුරුදු උත්සවය පැවැත්වීමේදී කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 2426/6 හා 2025.03.03 දිනැති අති විශේෂ චක්‍රලේඛනයේ සඳහන් නීතීන් උල්ලංඝනය නොවන පරිදි කටයුතු කරන ලෙසත් දැනුවත් කළ යුතුය.
06. අළුත් අවුරුදු උත්සවය පැවැත්වෙන ස්ථානය සමෘද්ධි බැංකු ඉතුරුම් හා ණය වැඩසටහන් පිළිබඳව ප්‍රචාරණ කටයුතු ද සිදුකිරීම හා ප්‍රචාරණ බැනරයක් ප්‍රදර්ශනය කිරීමටද අදාල සංවිධානයට දැනුම් දිය යුතුය.

## 06. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රගතිය ලබාදීම.

| වාර්තාව ලබාදිය යුතු බැංකුව/ අංශය | වාර්තාව යොමු කල යුතු දිනය | වගකීම දරන නිලධාරියා | වාර්තාව යොමු කල යුතු බැංකුව/ අංශය | වාර්තාව එවීමට භාවිතා කල යුතු ආකෘතිය |
|---|---|---|---|---|
| **<u>ඉතුරුම් රැස් කිරීම් ප්‍රගතිය</u>** | | | | |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකුව | 2025.04.25 | බැංකු කළමණාකරු | සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | ඇමුණුම 01 |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | 2025.04.29 | බැංකු සමිති කළමණාකරු | දිස්ත්‍රික් සමෘද්ධි අංශය | ඇමුණුම 02 |
| දිස්ත්‍රික් සමෘද්ධි අංශය | 2025.05.06 | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | ක්ෂුද්‍ර මූල්‍ය අංශය | ඇමුණුම 02 |

දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් ඇමුණුම- 02 වාර්තාව සකස් කර microfinanceall2021@gmail.com විද්‍යුත් ලිපිනය හරහා ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවීම සිදුකළ යුතුය. මෙහිදී සමෘද්ධි බැංකු හෝ බැංකු සමිති විසින් වෙන වෙනම ප්‍රගති වාර්තා ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවීම සිදු නොකළ යුතුය.

07. සිංහල හා හින්දු අළුත් අවුරුදු ගණුදෙනු චාරිත්‍රය හා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඉතුරුම් ගිණුම් හිමියන්ට මුදල් තැන්පත් කිරීම පිළිබඳව දැනුවත් කිරීම සිදු කළ යුතු අතර. කිසිදු විටක ඉතුරුම් කිරීම සඳහා බලපෑම් කිරීම හෝ පෙළඹවීම නොකිරීමටද වගබලා ගත යුතුය.

08. 2025.04.15 දින විශේෂ බැංකු නිවාඩු දිනයක් යෙදී ඇති බැවින්, ප්‍රවර්ධනය වැඩසටහන මගින් රැස්වෙන මුදලින්, සමෘද්ධි බැංකු අතරැදි මුදල් සීමාව ඉක්මවා යාම සිදුවිය හැක. එබැවින් 2025.04.11 දින සමෘද්ධි බැංකුව සතු අතරැදි මුදල් සීමාව අවම මට්ටමක තබා ගැනීමට එදින මුදල් බැංකුගත කිරීම සිදුකළ යුතුය.

තවද, 2025.04.15 දින රැස්වන තැන්පතු මුදල් බැංකු ගත කිරිම සඳහා CDM යන්ත්‍රයක් මඟින් සිදු කළහැක. කෙසේ වෙතත් 2025.04.15 දිනට පමණක් වලංගු වන පරිදි අතරැදි මුදල් රක්ෂණ සීමාව බැංකු වලින් ඉවත් කිරීමට ද ක්ෂුද්‍ර මූල්‍ය අංශය කටයුතු කර ඇත.

එබැවින්, 2025.04.15 දින විශේෂ බැංකු නිවාඩු දිනයක් යෙදී තිබුණද ,ඉතුරුම් ප්‍රවර්ධනය සිදු කිරීමට ගැටළුවක් නොවන බවට දැනුම් දෙමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්
1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය -කා.දැ.පි.
2. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
   - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.
4. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි හා අ.ක.ස.
5. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.පි හා අ.ක.ස.
6. සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි හා අ.ක.ස.

**ඇමුණුම 01**

**<u>අළුත් අවුරුදු ගණුදෙනු හා අළුත් අවුරුදු තැන්පතු ප්‍රවර්ධන කාලය තුළ රැස්කරන ලද තැන්පතු ප්‍රගතිය - 2025</u>**

| සමෘද්ධි බැංකුවේ නම | ගණුදෙනු කරන ලද ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල රු. |
|---|---|---|
| | | |
| | | |
| | | |

සකස් කලේ:-

නම :-

අත්සන :-

දිනය :-

කළමණාකරුගේ සහතිකය

නම :-

අත්සන :-

දිනය :-

---

**ඇමුණුම 02**

**<u>අළුත් අවුරුදු ගණුදෙනු හා අළුත් අවුරුදු තැන්පතු ප්‍රවර්ධන කාලය තුළ රැස් කරන ලද තැන්පතු ප්‍රගතිය - 2025</u>**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය/ දිස්ත්‍රික්කය :- ........................................................................

| බැංකුවේ නම | ගණුදෙනු කරන ලද ගිණුම් සංඛ්‍යාව | රැස් කරන ලද තැන්පතු මුදල රු. |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| **එකතුව** | | |

සකස් කලේ:-

නම :-

අත්සන :-

දිනය :-

බැංකු සමිති කළමණාකරු/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ සහතිකය

නම :-

අත්සන :-

දිනය :-